# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2293/28 - 2022 අගෝස්තු මස 17 වැනි බදාදා - 2022.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : කේඩීඑස්/කේජීකේ/4/2(2)/2018/02/04.
*අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/12/2018/ඩබ්එස්/290.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර කඩවත්සතර හා ගඟවටකොරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැවතැන්න(274), ග්‍රාම නිළධාරී කොට්ඨාසයේ, අළුපතකඩහේන, මුල්ලේපිහිල්ල ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් මැන සකස් කරන ලද, 2022.06.30 දිනැති කැඩැස්තර සිතියම් අංක 320385 හි කලාප අංක 06 හි පත්‍ර අංක 27 හි කැබලි අංක 03 වන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0440 ක් වූ පහත සඳහන් ඉඩම් කැබැල්ල :

01. **කැබලි අංක 03**
ඉඩමේ නම: අළුපතකඩහේන; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කල්‍යාණි ප්‍රබෝධ දිසානායක, අංක 305, අළුපතකඩ, පල්ලේගම.;ප්‍රමාණය: හෙක්ටයාර් 0.0440.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 සැප්තැම්බර් මස 28 වැනි දින පෙරවරු 10.00ට මහනුවර කඩවත් සතර සහ ගඟවටකෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 සැප්තැම්බර් මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

යූ.ජේ.එම්.එස්.එස්.බී. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත්සතර හා
ගඟවට කෝරළේ.

2022 අගෝස්තු මස 10 වැනි දින,
මහනුවර කඩවත්සතර හා ගඟවට කෝරළේ,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0143

1A - G 37251 - 21 (2022/08)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk .